# මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ මහනුවර මහ නගර සභාවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන සේවා ගණයේ (MN- 01) ප්‍රජා සෞඛ්‍ය නිලධාරී තනතුර සඳහා වන උසස් කිරීමේ පරිපාටිය

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ මහනුවර මහ නගර සභාවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන සේවා ගණයේ (MN -01) ප්‍රජා සෞඛ්‍ය නිලධාරි තනතුර දරන්නන්ට ශ්‍රේණි උසස් කිරීම් සඳහා සකස් කරන ලද මෙම පරිපාටිය මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කළ දිනයේ සිට මධ්‍යම පළාත තුළ ක්‍රියාත්මක වේ.

01. සම්බන්ධ වන ආයතන

1.1 දෙපාර්තමේන්තුව : පළාත් පාලන දෙපාර්තමේන්තුව
යොමු අංකය: CPC/CLG/1/5/1-1 දිනය: 2023.09.13

1.2 අමාත්‍යාංශය : ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය
යොමු අංකය: සීපීසී/සීඑම්එස්/01/06/43 දිනය: 2023.09.20

1.3 මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය
යොමු අංකය : CPC/Cs/2/17/1/SOR/CLG7/2023/ප්‍රජා.සෞ.නි. දිනය: 2023.10.14

1.4 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම
යොමු අංකය : DMS/CP/0601/Vol-111 දිනය: 2022.11.30

1.5 රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය
යොමු අංකය : EST-2/06/CP-REC/0203 දිනය: 2024.04.24

1.6 මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය
යොමු අංකය : CPC/PSC/32/LG/SOR/ප්‍ර.සෞ.නි. දිනය: 2024.05.07

1.7 ගරු ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය
යොමු අංකය : GCP/04/ම.න.ස./පරිපාටි දිනය: 2024.05.28

02. පත්කිරීම් බලධරයා : මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් බලය පවරන ලද පළාත් පාලන කොමසාරිස්

03. නිලධර ගණය පිළිබඳ විස්තර :

3.1 **සේවා ගණය** : කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2

3.2 **ශ්‍රේණි** : III , II හා I ශ්‍රේණිය

3.3 **තනතුරෙහි ස්වභාවය** : ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය.

04. පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :

ආයතනයන්හි විධායක කළමනාකරණ හා පරිපාලන කාර්යයන්හි නියුතු වුවන්ගේ කාර්යයන්ට උපස්ථම්භක හා / හෝ පහසුකාරක කර්තව්‍යන් අතුරින් තාක්ෂණික ස්වභාවයේ නොවන්නාවූද, ඒකල ස්වරූපයේ වූද, කාර්යයන් මෙම සේවා ගණනයට පැවරේ. මෙම ගණයේ කාර්යයන් අතුරින් පත්කිරීම් බලධාරියා විසින් විශේෂයෙන්ම නියම කොට දක්වන ලද කාර්යයන් මෙම සේවා ගණනයට අයත් නිලධරයන් විසින් ඉටු කරනු ලැබිය යුතුය.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2024-05-28 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

4.1 කාර්යයන් පැවරීම :

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයෙකුට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලැබිය හැක.

05. වැටුප්

5.1 වැටුප් කේත අංකය : MN 01 -2016

5.2 මාසික වැටුප් පරිමාණය : රු. 27,140 – 10 x300– 11x350 -10 x495- 10 x660 - රු.45,540/-

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු.) |
|---|---|---|
| III | පියවර 01 | 27,140/- |
| II | පියවර 12 | 30,490/- |
| I | පියවර 23 | 34,485/- |

06. නිලධර ගණයට අයත් තනතුර :

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| ප්‍රජා සෞඛ්‍ය නිලධාරි | III/II/I | 07 | බෝවන රෝග මර්ධන කටයුතු, සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන් (ප්‍රජා , පාසැල්, පෙරපාසල්) කාන්තාවන්ගේ ආර්ථික තත්වය නගා සිටුවීම සඳහා කාන්තා සමිති පිහිටුවීම , ස්වයං රැකියා පුහුණු කිරීම් කටයුතු හා වෙළඳපොල වෙත යොමු කිරීම, අඩු ආදායම් ලාභීන්ගේ යටිතල පහසුකම් නගා සිටුවීම සඳහා අදාල අංශ වෙත යොමු කිරීම, ළමා සමිති පිහිටුවා ළමුන්ගේ විවිධ ක්‍රියාකාරකම් නගා සිටුවීමට උදව් කිරීම. |

6.2 ඒකාබද්ධ නිලධාරි සංඛ්‍යාව : 07

" ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා III, II හා I ශ්‍රේණීන් සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ. "

07. බඳවා ගැනීමේ ක්‍රමය :

නව බඳවාගැනීමක් සිදුනොවේ. තනතුර දරන්නාට පමණක් පෞද්ගලික වන පරිදි අනුමත කර ඇති තනතුරුවලට අදාළව ප්‍රජා සෞඛ්‍ය සහායක නිලධාරි තනතුරු 07ක් යටපත් කර, ඇති කරන ලද ප්‍රජා සෞඛ්‍ය නිලධාරි ලෙස සේවය කරන පිරිස සඳහා උසස්වීම් ලබාදීම සඳහා පමණක් සකස් කර ඇත.

08. කාර්යක්ෂමතා කඩඉම : අදාළ නොවේ.

09. භාෂා ප්‍රවීණතාවය : අදාල නොවේ.

10. ශ්‍රේණි උසස් කිරීම : අදාළ නොවේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින් 2024-05-28 දින අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

11. සේවයේ යෙදී සිටින්නන් අන්තර්ග්‍රහණය කිරීම :

දැනට සේවයේ යෙදී සිටින තනතුර දරන්නාට පෞද්ගලික වනසේ තනතුරු අනුමත කර ඇති 07 දෙනා ගරු ආණ්ඩුකාරතුමා අනුමත කරන දින සිට මෙම උසස් කිරීමේ පරිපාටියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

අන්තර්ග්‍රහණයන් හේතුවෙන් වැටුප් වර්ධක දිනයේ වෙනසක් සිදු නොවේ.

I වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය

i. III ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු විස්ස (20) කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති, එමෙන්ම අදාළ කාලය තුළ වැටුප් වර්ධක විස්ස(20) ක් උපයාගෙන ඇති නිලධාරීන්
ii. II ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු දහය (10) කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් ඇති එමෙන්ම අදාළ කාලය තුළ වැටුප් වර්ධක (20) කට නොවැඩි සතුටුදායක සේවා කාලයක් ඇති එමෙන්ම අදාල කාලය තුළ වැටුප් වර්ධක දහය(10) ක් උපයාගෙන ඇති හා අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති නිලධාරීන්
iii. MN 1 -2006 A වැටුප් පරිමාණයේ I ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක සේවය කරන නිලධාරීන්,
MN1 – I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

12. අන්තර්කාලීන විධිවිධාන

i. දැනට සේවයේ නියුතු නිලධාරීන් MN 1 වැටුප් පරිමාණය යටතේ 1 ශ්‍රේණියට අදාළ වැටුප් වර්ධකය උපයාගත් දින සිට 1 ශ්‍රේණියට උසස් කරනු ලැබේ.
ii. දැනට සේවය කරනු ලබන සියලුම නිලධාරීන්ට 23 වැනි වැටුප් පියවර දක්වා වැටුප් වර්ධක ලබාදී ඇත. එබැවින් කාර්යක්ෂමතා කඩඉම් අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

13. තනතුරු වලට පත්කිරීම -

**මහනුවර මහා නගර සභාවේ දැනට සේවයේ නියුතු ප්‍රජා සෞඛ්‍ය නිලධාරීන් සඳහා පමණක් අදාල වේ. මෙම නිලධාරීන් සේවයෙන් ඉවත් වූ පසු මෙම තනතුරු අහෝසි වේ. (මෙම තනතුරු දරන්නාට පෞද්ගලික වන සේ අනුමත තනතුරු වේ.)**

14. අර්ථ නිරූපණ :

14.1 "ගරු ආණ්ඩුකාරවරයා" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා /ගරු ආණ්ඩුකාරතුමිය වේ.
14.2 "පත්වීම් බලධාරියා" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් පලාත් පාලන කොමසාරිස්වරයා වේ.
14.3 "ලේකම්වරයා" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරයා වේ.
14.4 "දෙපාර්තමේන්තු ප්‍රධානියා" යනුවෙන් අදහස් කරනුයේමධ්‍යම පළාත් පලාත් පාලන කොමසාරිස්වරයා වේ.
14.5 "රාජ්‍ය සේවා කොමිෂන් සභාව " යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වේ.
14.6 "සක්‍රිය සේවා කාලය" යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත නිවාඩු හැර අනෙකුත් සියළුම වැටුප් රහිත නිවාඩු කාලපරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.
14.7 "සතුටුදායක සේවා කාලය" යනු රජයේ නිළධාරියෙකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරි ඉටු කිරීම මඟින්ද සිදු කළ යුතුව තිබූ පත්වීම් ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මඟින්ද එම කාලය තුලදී උපයාගත යුතුව තිබූ සියළුම වැටුප් වර්ධක උපයා ගෙන ඇත්තා වූ සහ ඔහු විසින් දඬුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දා වූ කාලසීමාවක් වන්නේය.



ගරු ආණ්ඩුකාරතුමා විසින්
2024 - 05 - 28 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

14.8 "ගැසට් පත්‍රය " යනුවෙන් අදහස් කරනුයේ ශ්‍රී ලංකා සමාජවාදී ජනරජය විසින් පළ කරනු ලබන ගැසට් පත්‍රය වේ.

14.9 "ප්‍රසිද්ධ දැන්වීම්" යනුවෙන් අදහස් කරනුයේ රජයේ ප්‍රසිද්ධ පුවත්පත් වල පල කරනු ලබන දැන්වීම් වේ.

15. මෙම උසස්කිරීමේ පරිපාටියේ විධිවිධාන සළසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගරු ආණ්ඩුකාරතුමාගෙන් විමසා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය පරිදි තීරණය කරනු ලැබේ.

16. සෑම පත්වීමක් සම්බන්ධයෙන් ම ආයතන සංග්‍රහයේ විධිවිධාන, මූල්‍ය රෙගුලාසි, මධ්‍යම පළාත් සභා මූල්‍ය රීති සහ රජය/මධ්‍යම පළාත් සභාව විසින් කලින් කලට පනවනු ලබන නීති රීති හා /හෝ රෙගුලාසි අදාළ වේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2024 - 05 - 28 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

(4)

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය :- නිර්දේශ කරමු

1. ගාමිණී රාජරත්න මහතා (සභාපති) ..............................

2. ඩබ්ලිව්.එම්.එස්.ඩී.වීරකෝන් මහතා (සාමාජික) ..............................

3. ජේ.එම්.ආර්.බී. තෙන්නකෝන් මහතා (සාමාජික) ..............................

4. එච්.එම්.ඩී.ආර්. හේරත් මහතා (සාමාජික) ..............................

5. ජේ.ඩී.කේ.වික්‍රමරත්න මහතා (සාමාජික) ..............................

6. පී.ටී.ජී. ගුණතිලක මහතා (සාමාජික) ..............................

7. සී.පී.එස්.ඉලංගසිංහ මහතා (සාමාජික) ..............................

දිනය : 2024. 05. 07

ආණ්ඩුකාර ලේකම් ,

2024.05.07 දිනැති කොමිෂන් සභා වාර්තාවේ අංක 2024/1212 යටතේ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද "මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ මහනුවර මහ නගර සභාවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන සේවා ගණයේ (MN – 01) ප්‍රජා සෞඛ්‍ය නිලධාරි තනතුර සඳහා වන උසස් කිරීමේ පටිපාටිය " ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

දිනය : 2024/05/10

..............................

ලේකම් ,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත.

නිල මුද්‍රාව.

කුමුදිනී එස්. ප්‍රේමචන්ද්‍ර
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත

ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය :- අනුමත කරමි. / නොකරමි.

නීතිඥ ලලිත් යූ. ගමගේ
ආණ්ඩුකාරවර
මධ්‍යම පළාත
2024-05-28